# අපනයන බෝගයන්ගේ නවජීවනයක්

අනාදිමත් කාලයක සිට ශ්‍රී ලංකාව කුළු බඩු පිළිබඳව පතළ කීර්තියක් ඉසිලීය. කුරුඳු මෙම කුළුබඩු අතර සුවිසේස තැනක් ගත්තේය. ලංකාව ඉංග්‍රීසි යටත් විජිතයක් වීමෙන් පසු කෝපි හා ස්වාභාවික වෘක්ෂ ලතා දියෙන් බොහොමම පොහොසත් ඇමසන් නදී අසබඩ තිර භූමි කොටසේ රබර් හා කොකෝවාද ආර්ථික බෝග වශයෙන් හඳුන්වා දෙනු ලැබූ අතර මෙයින් ලක් පොලවෙන් අක්කර 2,80,000 රබර් වගා කිරීම කෝපි වගාව මලකඩ දිලීර රෝගය කළ විභාග යන් සමගම අක්කරයට ඇද වැටුනි. මෙයින් පසු තේ කාර්මාන්තය කෝපි වලින් හිස් වූ තැන පුරවා ලූ අතර පසුව තේ රබර් හා පොල් මෙරටේ ප්‍රධාන ආර්ථික වැවිලිද විදේශ විනිමය උලපත්ද බවට පත්විය. මේ සමග කුරුඳු, කොකෝ, කරදමුංගු කරාබුනැටි, සාදික්කා, ගම්මිරිස් වැනි වෙනත් බහු වාර්ගික ආර්ථික වැවිලි කෙමෙන් පසු පසට තල්ලු වූයේ නිතැතිනි.

එහෙත් එක්දස් නවසිය හැත්තෑ දෙක වසර මෙසේ පසෙකට ඇද දමා තිබූ සුළු ආර්ථික බෝග වගාවට නව පනක් ලබා දුන් වර්ෂයක් බවට ඉතිහාසයට එක්වූයේ සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවේ බිහිවීමත් සමගය. එම දෙපාර්තමේන්තුව පිහිටවූයේ මෙසේ සම්ප්‍රදයික එහෙත් අඩාල වී තිබූ බෝග වගාවන්ට නව ජීවයක් දීම ප්‍රධාන ආර්ථික වැවිලි වල සම්පූර්ණ නිෂ්පාදනය ලබා සිටි ලංකා ආර්ථිකය එම තත්වයෙන් වැඩි දුරටත් මුදවා ගැනීමටත් නිසරු තේ සහ රබර් වල භෝග විවිධාංගී කරණයත් තම ඉඩම් වල වැවිලි වගා කිරීමත් වැනි ජාතික අභිම තාර්ථයන් සපුරා ගැනීම උදෙසා සුළු අපනයන බෝග ප්‍රවර්ධනයට ආදී පර්යේෂණ, උපදේශාත්මක හා සංවර්ධනාත්මක සේවාවන් සැපයීම සඳහාය.

වර්තමානයේ දෙපාර්තමේන්තු වෙන් ඉටු කෙරෙන කාර්ය භාරයන් රැසකි. සුළු අපනයන භෝග වගාව සංවිධානය හා ප්‍රවර්ධනය කිරීම, ඒවා පිළිබඳ පර්යේෂණ, පැවැත්වීම, රෝපන ද්‍රව්‍ය ලබා දීම, ගොවීන් හා අදාල වෙනත් පුද්ගලයින් පුහුණු කිරීම, ව්‍යාප්ති හා අධ්‍යාපනික සේවාවන් ලබාදීම හා වගා කරුවන්ට අවශ්‍ය දැනුම ලබාදීම ආදියයි. මෙම කාර්ය භාරය ඉටු කිරීමෙහි ලා දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති හා පර්යේෂණාත්මක අංශ දෙක අත්වැල් බැඳ ක්‍රියාත්මකව පවතී.

ව්‍යාප්ති අංශය දැනට ප්‍රධාන වශයෙන් නැවත වගාවට අදල සහනාධාර සැපයීමේ කටයුතු රෝපන ද්‍රව්‍ය ලබාදීම සඳහා කටයුතු සම්පාදනය කිරීම හා ක්‍රියාමත්ක කිරීම කරනු ලබයි. දෙපාර්තමේන්තුවේ සහනාධාර ක්‍රම තුනක් හඳුන්වා දී ක්‍රියාත්මක කරගෙන යමින් පවතී.

1. අක්. ½ කට වැඩි ඉඩම් සඳහා තනි වගාවට සහනාධාර ක්‍රම හා නැවත වගාව යන ක්‍රියා කාරකම් දෙකම මෙයින් ආවරනය කෙරේ.

2. අක්. ½ ට අඩු ගෙවතු වගා සහනාධාර ක්‍රමය හා

3. අතුරු බෝග සඳහා සහනාධාර ක්‍රමය

යනු එම සහනාධාර ක්‍රම තුනයි.

මේ සඳහා මුදලින් ලැබෙන සහනාධාරයට අමතරව රෝපන ද්‍රව්‍ය ලබාදීමද සිදු කරයි. 1973 වර්ෂයේ තිබූ ටොන් 60 දන් ලියා පදිංචි ටොන් 442 දක්වා වැඩි කොට ඇති අතර 1982 වර්ෂය තුල ලබාගත් අක්කර 2,400 ක් වගා කිරීමට තරම් රෝපන ද්‍රව්‍ය ලබාදී තිබේ. 1982 වර්ෂයේ බලපත්‍ර 7,524 ක් නිකුත් කොට තිබීමෙන්ද සහනාධාර ක්‍රමය ජනප්‍රිය වී ඇති අයුරු හෙළි කෙරෙයි. මේ හැරුණු විට ගොවි පුහුණු පන්ති පැවැත්වීම, ක්ෂේත්‍ර ගොවීන් සඳහා සේවාස්ත පුහුණු වැඩ සටහන් දියත් කිරීම, ප්‍රදර්ශක කටයුතු වලට සහභාගී වීම හා ආදර්ශ වගාවන් පවත්වා ගෙන යාම වැනි විවිධ ක්‍රියාකාරකම් වල ව්‍යාප්ති අංශය නිරත

වී ඇත. සුළු අපනයන බෝග වගා කෙරෙන දිස්ත්‍රික් 14 න් 11 කට ව්‍යාප්ති කටයුතු සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම උදෙසා සහකාර අධ්‍යක්ෂ වරුන් පත්කොට ඇති අතර ඔවුන් සමග කටයුතු කෙරෙන ව්‍යාප්ති නිලධාරි වරු ඉහතකී දිස්ත්‍රික් 14 පුරා මැතිවරණ කොට්ඨාශ මට්ටමින් විසිරී සිටිති. සෑම විටම කාර්යක්ෂම ව්‍යාප්ති සේවයක් සැපයීම ව්‍යාප්ති අංශයේ එකම අරමුණ වන අතර ඒ සඳහා වගා කරුවන්ගේද සහයෝගය ලැබිය යුතුය. වගා කරුවන් සිය සහනාධාර ඉල්ලුම් පත්‍ර කලට වේලාවට ඉදිරිපත් කිරීමත්, ක්ෂේත්‍ර නිලධාරියා සමග සහයෝගයෙන් කටයුතු කිරීමත්, දෙනු ලබන උපදෙස් නිසි පරිදි ක්‍රියාත්මක කිරීමත්, නිතර ක්ෂේත්‍ර නිලධාරීන් හමුවී උපදෙස් ලැබීමත් වඩාත් හොඳ ව්‍යාප්ති සේවකයනට ඉන් සල කනු නොඅනුමානය.

පර්යේෂණ අංශය දස වසරක් පමණ කෙටි කාලයක් තුළදී අඩු පහසුකම් වැනි විවිධ දුෂ්කරතා වැඩ ගැන සෑහෙන දුරක් ගමන් කොට ඇත. පර්යේෂණ කටයුතු වලදී ප්‍රමුඛ තාව අනුව කොටසකට බෙද සලකන අතර කෝපි, කුරුඳු, කරදමුංගු, ගම්මිරිස්, කරාබු හා කටුකොහොල්ලා යන භෝග ඉහළම ප්‍රමුඛතාවය ලබයි. ප්‍රධාන පර්යේෂණ මධ්‍යස්ථානය මාතලේ පිහිටා ඇති අතර, ඇල්පිටිය මැදරට පර්යේෂණ ස්ථානය, වාරියපොල ඉහළ උෂ්නාංශ පර්යේෂණාස්ථානය, ගම්මඩුව එනසාල් පර්යේෂණ ඒකකය හා කුණ්ඩසාලේ පර්යේෂණ ඒකකය එහි ශාඛා පර්යේෂණ ලෙස ක්‍රියා කරති. අතුරු භෝග පර්යේෂණ සඳහා ප්‍රමුඛතාවය ලබා දිය හැකි පරිදි පානදුර පර්යේෂණ ඒකකය මෑතදී පිහිටු වනු ලැබීය. ප්‍රධාන වශයෙන් සෑම වර්ගයේම මධ්‍යස්ථානයකම ක්ෂේත්‍ර පර්යේෂණ කටයුතු කෙරෙන අතර මාතලේ විද්‍යාගාර පර්යේෂණ කටයුතු සිදු කරති.



කරාබු පැල තවානක් පරීක්ෂා කරන පර්යේෂණ නිලධාරි


පොහොර හා ශාඛා පරතර අත්හදා බැලීම, අතුරු හා මිශ්‍ර භෝග පර්යේෂණය තවාන් ශිල්ප ක්‍රම අත්හදා බැලීමේ කටයුතු හැරුනු විට විවිධ ශාක රෝග හා පළිබෝධයන් පිළිබඳ අධ්‍යාපන කටයුතුද, ක්ෂුද්‍ර ප්‍රචාරක ක්‍රමද දැනට සිදු කෙරෙන පර්යේෂණ අතර වෙති. අතුරු හා මිශ්‍ර පසු වාර්ෂික භෝග වගාව රටතුල ජනප්‍රිය කරවීම, ගම්මිරිස් වල වේගවත් පැල නිෂ්පාදන ක්‍රමයන් හඳුන්වා දීම, නව ගම්මිරිස්, ප්‍රභේදයන් නිකුත් කිරීම හා වෙනත් විවිධ බෝගවල නව ප්‍රභේද ලංකාවට හඳුන්වා දීම හා ගෙවතු වගා සඳහා ඉතා අගනා වගා ආදර්ශයන් හඳුන්වා දීමද පර්යේෂණ අංශයෙන් මෙතාක් සිදුකළ කාර්යයන් අතර වෙයි.

ඒ ඒ සුළු බෝග වගාවට අදල සියලුම ගණක විද්‍යාත්මක විස්තර ශිල්ප ක්‍රම කැටි කොට දෙපාර්තමේන්තුව විසින් පොත් පිංච පෙලක් පල කොට ඇති අතර ඒවායේ උසස් ඵලදවක් ලබා ගැනීමට පිළිපැදිය යුතු දෑ පිළිබඳ මෙන්ම ඵලදව ශ්‍රේණිගත කරන ආකාරය පිළිබඳවද පැහැදිලි කර දී ඇත. එයට අමතරව ක්ෂේත්‍රයෙන් මතුවන විවිධ රෝග හා පළිබෝධයන් සම්බන්ධ ගැටලු හා වෙනත් කරුණු විසඳා ගැනීම සඳහා ව්‍යාප්ති හා පර්යේෂණ අංශයක් වගා කරුවන් සඳහා විවෘතව ඇත.

සුළු අපනයන දෙපාර්තමේන්තුවේ ඉතා වැදගත් අංශයක් නම් එහි පර්යේෂණ අංශයයි. මෙම ක්ෂේත්‍රයෙහි භෝග වර්ග පිළිබඳව පර්යේෂණ සිදුකර, එම පර්යේෂණ වල ඵල ලැබෙන ප්‍රතිඵල ව්‍යාප්ති අංශය මගින් ගොවීන්ට ලබාදීම එහි ප්‍රධාන කාර්යයයි. ඒ පිළිබඳව විස්තරයක් කළ එහි ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි ආචාර්ය පරාක්‍රම ගුරුසිංහ මහතා : අපේ පර්යේෂණ අංශය මගින් පැපොල්, ගම්මිරිස් කොකෝ, ගෝවා, කරාබු හා එන්සාල් වැනි භෝග කෙරෙහි අවධානය යොමුකර තිබෙනවා. එමගින් අපේ සම්ප්‍රදයික වර්ග විදේශ වර්ග හා ඒකාබද්ධ කර සාර්ථක භෝග නිපදවීමට මෙම කාලය තුළදී අපට හැකියාව ලැබුනා.

මෙම දෙපාර්තමේන්තුවට අයත් තවත් සිත් ගන්නා ස්ථානයක් නම්, ගම්පොල ගස්නෑව පිහිටා ඇති එහි ක්ෂේත්‍ර ගොවිපලයි. විවිධ පර්යේෂණයන් කරමින් නව ආකාරවලට එම භෝග වවන මෙම ආයතනය, අධ්‍යාපන මධ්‍යස්ථානයක් වෙනවා. එය භාර පර්යේෂණ නිලධාරි ඩබ්ලිව්. එච්. ඒ. ප්‍රේමරත්න හා පර්යේෂණ නිලධාරි චන්ද්‍රලාල් යන මහත්වරුන් විසින්, විශේෂයෙන් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියන්හි නිලධාරීන්ට මෙම භෝග පිළිබඳව පුහුණුවක් ලබාදෙනු ලබයි. මෙහි විශේෂයක් වන්නේ එම ගොවිපලෙහි ප්‍රවර්තන වියදම් සියල්ල එයින් ලබා ගැනීමට හැකි වීමයි.

සුළු අපනයන භෝගවලින් ඉපැයෙන විදේශ විනිමය පොල් වලින් ලැබෙන විදේශ විනිමය ප්‍රමාණය ඉක්මවා යමින් පවතී. ඒවාට තවදුරටත් "සුළු" යන විශේෂයක් යෙදීමට නොහැකිවන තරමට මැද භාගයේදී කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ පෙරලියක් කිරීමට මෙම භෝග සමත්ව ඇත. එයට මෙම වසර දහයකුත් මසක් වයසැති ලාබාල දෙපාර්තමේන්තුව විසින් දුන් අනුබලය ඉතා විශාල හා ඉතා වැදගත්වේ.



ආචාර්ය ගුරුසිංහ

ඉතා පහත් අඩියකට පත්වතිබූ සුළු අපනයන භෝග වගාව නැවත ප්‍රතිෂ්ඨාපනය කොට අක්. 1,50,000 ක් ව්‍යාප්ති කරවීමටත්, 1973 දී රුපියල් දස ලක්ෂ 67 ක්වූ විදේශ විනිමය ඉපැයීම 1982 දී රු. දශ ලක්ෂ 776 දක්වා නැංවීමටත් හැකි වීම සුළු අපනයන බෝග දෙපාර්තමේන්තුවෙත්, පොදුවේ ශ්‍රී ලාංකික මහජනතාවගේත් ජයග්‍රහණයක් වන්නා සේම යහපත් අනාගතයක සුබ සිහින මල්ඵල ගැනීම පිළිබඳ පෙර නිමිත්තක්ද වන බව මොනවට පැහැදිලිය.

"ගොවි ජනතාව" තිතිපතා
ලබා ගැනීමට දායක වන්න